මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
මැතිවරණ මහලේකම් කාර්යාලය, නො.02 සරණ මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව
தேர்தல்கள் செயலகம், இல.02 சரண மாவத்தை, இராஜகிரிய, இலங்கை
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **PE/2024/17** **2024.10.09**

# පාර්ලිමේන්තු මැතිවරණය - 2024.11.14

## ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කළ යුතු තැනැත්තන්ගේ ලැයිස්තුව (ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර අපේක්ෂක ලැයිස්තුව)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මැතිවරණය සඳහා තරඟ කරනු ලබන සෑම දේශපාලන පක්ෂයක් / ස්වාධීන කණ්ඩායමක් විසින්ම ජාතික ලැයිස්තුව යටතේ තෝරාපත් කර ගනු ලැබීමට සුදුසුකම් ඇති තැනැත්තන්ගේ ලැයිස්තුවක් නාමයෝජනා කාලසීමාව, එනම් 2024.10.04 දින සිට 2024.10.11 දින මධ්‍යාහ්න 12.00 අතර කාලය තුළ රාජගිරිය මැතිවරණ කොමිෂන් සභා කාර්යාලයට භාර දිය යුතු වේ.

ජාතික ලැයිස්තුව සඳහා අපේක්ෂකයන් නම් කිරීමේ දී සියළුම ජන කොටස්වල නියෝජනය ජාතික ජන සංඛ්‍යා අනුපාතයට අනුකූලවන බව හැකිතාක් සුරක්ෂිත කිරීමට කටයුතු කළයුතු අතර, ප්‍රමාණවත් කාන්තා නියෝජනයක් අත්‍යවශ්‍ය වන බවත් සැලකිය යුතු ය.

ජාතික ලැයිස්තුවේ නම් සඳහන් තැනැත්තන් හෝ පාර්ලිමේන්තු මැතිවරණයේදී යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍රයක නම් ඇතුළත් තැනැත්තන් හැර වෙනත් තැනැත්තන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ මන්ත්‍රීවරුන් ලෙස පත් කිරීමට හැකියාවක් නොමැත.

ජාතික ලැයිස්තු මන්ත්‍රීධුර අපේක්ෂක ලැයිස්තුව භාරදෙන අවස්ථාවේදී 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත ප්‍රකාරව ජාතික ලැයිස්තුවේ සියළුම අපේක්ෂකයන් ද ඔවුන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ මැතිවරණ කොමිෂන් සභාව වෙත භාරදිය යුතු වේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්